**අක්කරෙයිපත්තු මහා නගර සභාව - 2022**

---------------------------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

අක්කරෙයිපත්තු මහා නගර සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුම, මුදල් ප්‍රවාහ ප්‍රකාශය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන මහා නගර සභා ආඥා පනතේ (252 අධිකාරය) 219 වගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට අක්කරෙයිපත්තු මහා නගර සභාවේ මූල්‍ය තත්ත්වය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය සහ මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මහා නගර සභාවේ මූල්‍ය වර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව මහා නගර සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇති වන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව්කිරීම් අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂයපථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල මහා නගර සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගැයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලැසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;
- අදාළ ලිඛිත නීතියකට හෝ මහා නගර සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මහා නගර සභාව ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) මහා නගර සභාවේ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මහා නගර සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(i)(ඈ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.6.1 ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් මාසයේ වැටුප් හා සහික දීමනා රු.6,938,129 ක් ලැබිය යුතු මුදලක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | ප්‍රවර්තන වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල හිඟ වැටුප් විස්තරයේ ඇතුළත් කිරීමට කටයුතු කර ඇති බව. | මූල්‍ය ප්‍රකාශන නිවැරදිව පිළියෙල කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේදී මහා නගර සභාව විසින් ලබාදුන් වරිපනම් හා බදු වට්ටම් රු.100,203 ක් මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර නොතිබුණි. | -එම- | -එම- |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් පරිත්‍යාග වශයෙන් ලැබූ ආදායම් ඒකක 09 ක එකතුව රු.695,084 ක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | ස්ථාවර වත්කම්වල දැක්වීමට කටයුතු කරන බව. | -එම- |
| (ඈ) | සමාලෝචිත වර්ෂය අවසාන දිනට පැවැති රු.204,565 ක් වූ විදුලි උපකරණ හා ලිපිද්‍රව්‍ය තොගයේ වටිනාකම ගිණුම් ගත කර නොතිබුණි. | ඉදිරි වර්ෂයේ ගිණුම් ප්‍රකාශනවල ගබඩා ගිණුමට එකතු කිරීමට කටයුතු කරන බව. | -එම- |

**1.6.2 නොසැසඳුණු පාලන ගිණුම් හෝ වාර්තා**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මහා නගර සභාවේ මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය අවසාන දිනට දේශීය ණය සංවර්ධන අරමුදලට ගෙවිය යුතු ශේෂය සහ දේශීය ණය සංවර්ධන අරමුදලේ ප්‍රධාන කාර්යාලයීය පොත්වල දක්වා තිබූ පසුගිය ශේෂ අතර රු.1,262,967ක් වෙනසක් නිරීක්ෂණය විය. | පොත්පත් සමග සැසඳීමට කටයුතු කරන බව. | මූල්‍ය ප්‍රකාශන නිවැරදිව පිළියෙල කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පුනරාවර්තන වියදම් ඉක්මවූ ආදායම රු. 22,325,733ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම් ඉක්මවූ ආදායම රු. 322,737ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සභාව විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබුණු ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ විස්තර පහත දැක්වේ.

| | | 2022 | | | | 2021 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම් | බිල්කළ ආදායම් | රැස්කළ ආදායම් | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම් | බිල්කළ ආදායම් | රැස්කළ ආදායම් | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| i. | වරිපනම් හා බදු | 16,953,530 | 60,981,177 | 8,358,686 | 52,622,490 | 11,525,000 | 14,253,530 | 8,617,597 | 46,727,647 |
| ii. | කුලී | 23,470,609 | 35,876,692 | 12,578,997 | 23,297,695 | 26,511,300 | 20,884,757 | 21,696,601 | 22,628,680 |
| iii. | බලපත්‍ර ගාස්තු | 5,200,000 | 3,475,500 | 3,475,500 | - | 5,725,000 | 2,962,800 | 2,962,800 | - |
| iv. | වෙනත් ආදායම් | 41,850,000 | 82,203,621 | 82,203,621 | - | 26,875,000 | 10,449,214 | 17,402,474 | 4,157,535 |
| | එකතුව | 87,474,139 | 182,536,990 | 106,616,804 | 75,920,185 | 70,636,300 | 48,550,301 | 50,679,472 | 73,513,862 |

#### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සභාවේ සියළුම ආදායම් රැස්කිරිමේ කාර්යසාධනය පිළිබඳ නිරීක්ෂණයන් පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **(අ) වරිපනම් හා බදු** | | |
| වර්ෂය ආරම්භයේදී හිඟ වරිපනම් බදු ශේෂය රු.46,727,647 ක් වූ අතර ඉන් වර්ෂය තුළ අයකිරීම් රු.5,912,440 ක් වුයෙන් වර්ෂ 01 සිට 07 දක්වා කාල පරාසයකට අදාළව තවදුරටත් අය විය යුතු ශේෂය රු.40,815,207 ක් විය. | ඉදිරි කාලයේදී රැස්කිරීමේ නිළධාරීන් පත් කර හිඟ වරිපනම් බදු අය කිරීමට කටයුතු කළ යුතුය. | අය කළ යුතු ආදායම් කඩිනමින් අය කර ගැනීමට පියවර ගත යුතුය. |
| **(ආ) කුලී** | | |
| (i) අක්කරෙයිපත්තු සුපිරි වෙළෙඳ සංකීර්ණයේ වානිජ පරිශ්‍ර කඩකාමර, වානිජ පරිශ්‍ර භූමිය, බස් නැවැතුම්පළ වානිජ පරිශ්‍ර කඩකාමර, මාළු වෙළෙඳපොළ, බස් නැවැතුම්පළ වැසිකිලි කුලි, බස් නැවැතුම්පළ කුලී සහ පෞද්ගලික වාහන නැවැතුම්පල ගාස්තු ආදිය කුලියට දීම සම්බන්ධයෙන් කුලී හිමියන් 226ක ගෙන් අයවිය යුතු රු. 12,598,164ක් 2012 වර්ෂයේ සිට සමාලෝචිත | හිඟ මුදල් අයකර ගැනීමටත් පොත්වලින් කපා හැරීමටත් පියවර ගෙන ඇති බව. | -එම- |

| | | | |
|---|---|---|---|
| | වර්ෂය දක්වා අයකිරීමට මහා නගර සභාව විසින් පියවර ගෙන නොතිබුණි. | | |
| (ii) | 1992 සිට 2021 දක්වා කාලපරිච්ඡේදයට අදාළව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු බදු කුලී රු.8,552,868 ක් විය. | -එම- | -එම- |
| **(ඇ)** | **මුද්දර ගාස්තු** | | |
| (i) | 2017 සිට 2020 දක්වා කාලපරිච්ඡේදයට අදාළව පළාත් සභාවේ ප්‍රධාන ලේකම් සහ අනෙකුත් බලධාරීන්ගෙන් ලැබිය යුතු මුද්දර ගාස්තු රු.782,450 ක් විය. | අයකිරීමට කටයුතු කරන බව. | ලැබිය යුතු ආදායම් කඩිනමින් ගෙන්වා ගත යුතුය. |
| (ii) | 2018 වර්ෂයේ සිට 2022 අගෝස්තු 30 දින දක්වා කාලපරිච්ඡේදයේ ජංගම සේවාවන් මගින් නැගෙනහිර පළාත් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් ඉඩම් හිමියන් 22 කගෙන් වැඩිපුර අයකර ගත් රු.1,066,997 ක මුද්දර ගාස්තු, පළාත් සභාවේ පළාත් සභාවේ ප්‍රධාන ලේකම් සහ අනෙකුත් බලධාරීන්ගෙන් ගෙන්වා ගැනීමට කටයුතු කර නොතිබුණි. | -එම- | -එම- |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ප්‍රාදේශීය සංවර්ධන ප්‍රදාන වැඩසටහන යටතේ 2017 වර්ෂයේදි මහා නගර සභාවට ලැබුණු ප්‍රචාරක ඉලෙක්ට්‍රෝනික රූපවාහිනිය 2019 වර්ෂයේ අක්‍රිය වී තිබුණි. | ප්‍රවර්තන වර්ෂයේ අළුත්වැඩියා කිරීමට කටයුතු කරන බව. | ප්‍රචාරක ඉලෙක්ට්රෝනික රූපවාහිනිය අළුත්වැඩියා කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයෙන් පානීය ජලය ලබාගැනීම සඳහා මහා නගර සභා බලප්‍රදේශයේ ප්‍රතිලාභීන් 184ක් විසින් කපන ලද කොන්ක්‍රීට්, තාර සහ ගැවල් මාර්ග ප්‍රතිසංස්කරණය සඳහා සමාලෝචිත වර්ෂය දක්වා රු.1,463,000ක් තැන්පතු ලෙස ප්‍රතිලාභීන්ගෙන් ලැබී තිබූ අතර විගණන දිනය වන විටත් මෙම මාර්ග ප්‍රතිලාභීන් විසින් ප්‍රතිසංස්කරණය කර තැන්පතු මුදල් අදාල ප්‍රතිලාභීන්ට ආපසු ගෙවීමට හෝ එම තැන්පතු භාවිතා කර සභාව විසින් මෙම මාර්ග ප්‍රතිසංස්කරණය කිරීමට පියවර ගෙන නොතිබුණි. එමනිසා, එම මාර්ග වලවල් සහිතව පැවැති අතර ඉදිරි කාලයේදී තවදුරටත් හානියට පත්වී සම්පූර්ණ ප්‍රතිසංස්කරණයක් කිරීමට සිදුවිය හැකිබව නිරීක්ෂණය විය. | පිළිතුරු ලබාදී නොමැත. | ජල සම්බන්ධතාව සඳහා කපනු ලැබූ මාර්ග ප්‍රතිසංස්කරණය කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | පළාත් පාලන දෙපාර්තමේන්තුව විසින් 2021 හා 2022 වර්ෂවල සභාවට පරිත්‍යාග කර තිබූ අයිතම 13ක වටිනාකම් ගණනය කර මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | භාණ්ඩවල ගැනුම් පිරිවැය ලබාගෙන මූල්‍ය ප්‍රකාශනවලට එකතු කිරීමට කටයුතු කරනු ලැබේ. | මූල්‍ය ප්‍රකාශන නිවැරදිව පිළියෙල කළ යුතුය. |

**3.2 වත්කම් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මහා නගර සභාවට අයත් හා සභාව විසින් භාවිතා කරනු ලබන ඉඩම් 28ක්, ගොඩනැගිලි සහ වාහන 18ක වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි. | ඉඩම්, ගොඩනැගිලි සහ වාහනවල වටිනාකම තක්සේරු කිරිමට කටයුතු කරන බව. | ඉඩම්, ගොඩනැගිලි සහ වාහනවල වටිනාකම තක්සේරු කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | සභාව සතු වාහන 12ක් අළුත්වැඩියා කර නැවත භාවිතා කිරීමට හෝ සුදුසු පරිදි අපහරණය කිරීමට පියවර ගෙන නොතිබුණි. | වාහන අළුත්වැඩියා කිරීමට පියවර ගෙන ඇති බව. | වාහන අළුත්වැඩියා කර නැවත භාවිතා කිරීමට හෝ වෙන්දේසියේ විකිණීමට සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඇ) | මහා නගර සභාව විසින් භාවිතා කරනු ලබන වාහන 09ක හිමිකාරිත්වය මහා නගර සභාවේ නමට පවරා ගෙන නොතිබුණි. | හිමිකාරිත්වය මාරු කිරිමට කටයුතු කෙරෙමින් පවතින බව. | වාහනවල හිමිකාරිත්වය මහා නගර සභාවේ නමට පවරා ගැනීමට කටයුතු කළ යුතුය. |

**3.3 ප්‍රසම්පාදන කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2022 වර්ෂයේ පුනරාවර්තන වියදම් වන සැපයුම්, සේවාවන් සහ අළුත්වැඩියා සඳහා රු.මිලියන 95ක් සහ මූලධන වියදම් සඳහා රු.මිලියන 11.3 ක්ද ඇස්තමේන්තු කර තිබුණත් සභාව විසින් ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර නොතිබුණි. | ප්‍රවර්තන වර්ෂයේ අවශ්‍යතා ලැයිස්තු සකස් කර සම්පූර්ණ ප්‍රසම්පාදන සැලැස්ම සකස් කර ඇති බව. | ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීමට පියවර ගත යුතුය. |

**3.4 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ජල උද්‍යානයේ ජල උද්‍යානයේ මහජන විනෝදාස්වාදය සඳහා රු.2,910,000 ක වියදමින් කුඩ තුනක් මිලදී ගෙන සවි කර තිබුණත්, මහජනතාවට එම කුඩය යට විවේක ගත හැකි ආකාරයට ආසන සකස් කර නොතිබුණි. එසේම, ජල උද්‍යානයේ ඇවිදින මං තීරුව පොකුණ මධ්‍යයේ පිහිටුවා ඇති බැවින් එය භාවිත කරන්නන්ගේ ආරක්ෂාව තහවුරු කිරීමට අවශ්‍ය විධිවිධාන සභාව විසින් සළසා නොතිබුණි. | ඉදිරි කාලයේදී මෙය ඉදිකිරිමට කටයුතු කරමින් පවතින බව. | භාවිත කරන්නන්ගේ පහසුව සහ ආරක්ෂාව තහවුරු කිරීමට අවශ්‍ය වැඩපිළිවෙළක් සකස් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ප්‍රාදේශීය සංවර්ධන ප්‍රදාන වැඩසටහන යටතේ අක්කරෙයිපත්තු මහජන පුස්තකාලයේ ඉලෙක්ට්‍රෝනික පුස්තකාලයක් රු.2,848,078 ක වියදමින් ස්ථාපිත කර තිබුණි. මෙය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කෝහා (KOHA) මෘදුකාංගය, සර්වර්,බාර්කෝඩ් රීඩර් සහ බාර්කෝඩ් ප්‍රින්ටර් වැනි ඉලෙක්ට්‍රෝනික උපකරණ පහසුකම් නොමැති වීම හේතුවෙන් මෙම ඉලෙක්ට්‍රෝනික පුස්තකාලය මෙහෙයවීමට නොහැකිව අභාවිතව පැවැතුණි. | වර්තමානයේ පවතින මූල්‍ය අර්බුදය නිසා මෙම මෙහෙයුම් කටයුතුවල කාල ප්‍රමාදයක් සිදු වූ බව . | මූල්‍ය ප්‍රතිපාදන මුළුමනින්ම සලසාගෙන අපේක්ෂිත ඉලක්ක ළඟාකර ගත හැකි පරිදි කටයුතු කළ යුතුය. |

## 3.5 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මහා නගර සභාවේ සේවය කර මියගිය සහ සේවය අත්හිටවූ නිලධාරීන් 07 කගෙන් අය කළ යුතු හිඟ ණය ශේෂ රු.193,799 ක් අය කර ගැනීමට 2007 වර්ෂයේ සිට මහා නගර සභාව විසින් කටයුතු කර නොතිබුණි. | හිඟ ණය අය කර ගැනීමට සහ කපා හැරීමට පියවර ගෙන ඇති බව. | හිඟණය ශේෂ අදාල අයගෙන් හෝ ඇපකරුවන්ගෙන් අය කර ගැනීමට පියවර ගත යුතුය. |

## 4. ගිණුම්කටයුතු භාවය හා යහපාලනය

## 4.1 ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාව දෛනිකව රැස් කරනු ලබන ඝන අපද්‍රව්‍ය අඩ්ඩාලච්චේනෙයි ප්‍රාදේශීය සභාවට අයත් ඝන අපද්‍රව්‍ය රැස්කිරීමේ මධ්‍යස්ථානයට ලබාදෙනු ලැබේ. එසේ ලබා දෙන දිරන අපද්‍රව්‍ය ටොන් එකක් සඳහා රු.200 ක් ද නොදිරන අපද්‍රව්‍ය ටොන් එකක් සඳහා රු.300 ක් ද ගෙවන අතර වෙන් නොකර ලබා දෙන ටොන් එකක් සඳහා රු.100 ක අතිරික්ත මුදලක් ගෙවීමට සිදුවී තිබුණි. මේ හේතුවෙන් සමාලෝචිත වර්ෂයේදී වෙන් නොකර ලබා දුන් ටොන් 1,587 ක් සඳහා අතිරේකව රු.476,202 ක් ගෙවා තිබුණි. | රටෙහි පැවැති ඉන්ධන අර්බුදය හේතුවෙන් වෙන් කිරීමේ ක්‍රියාවලිය විධිමත්ව සිදු කිරීමට නොහැකිව තිබුණු බව. | ඝන අපද්‍රව්‍ය වෙන් කර එකතු කිරීමට පියවර ගත යුතුය. |